ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | : නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව |
| **දිනය** | : 2020 ජූනි 04 |

## ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ ද ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී. ආයතනයේ තැන්පත් කරුවන්ට රක්ෂණ වන්දි ගෙවීම

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ වූ ප්‍රතිපාදනයන්ට අනුව ද ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී. ආයතනයට මූල්‍ය ව්‍යාපාර කටයුතු වල නියැලීම සඳහා ලබා දී තිබූ බලපත්‍රය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020.05.22 වන දින සිට බල පැවැත්වෙන පරිදී අහෝසි කර ඇත.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ පවතින ප්‍රතිපාදන අනුව රක්ෂණය වී ඇති සියලුම තැන්පත්කරුවන්ට රුපියල් 600,000.00 ක උපරිමයක් දක්වා වන්දි ගෙවීමට ශ්‍රී ලංකා මහ බැංකුව පියවර ගනු ඇත. නොගෙවූ ශේෂයක් වෙතොත් ද ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී. ආයතනයේ වත්කම් ඈවර කිරීමෙන් පසුව එකී මුදල් ලබා දෙනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම කටයුත්ත සඳහා පත් කර ඇති නියෝජිත බැංකු ආයතනය වන මහජන බැංකුව මගින් වන්දි මුදල් ගෙවීම සිදුකරනු ලැබේ. ද ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී. ආයතනයේ ශාඛා පැවති ප්‍රදේශයන්හි පිහිටා ඇති මහජන බැංකු ශාඛා මගින් පළමු අදියරේ ගෙවීම් කටයුතු එක් ගිණුමක් පමණක් හිමි තනි පුද්ගල තැන්පත්කරුවන් සඳහා 2020 ජූනි මස 07 දින සිට ආරම්භ කරනු ලැබේ.

මේ සම්බන්ද වැඩිදුර තොරතුරු පහත සඳහන් දුරකථන අංක ඇමතීමෙන් ලබාගත හැක.

මහජන බැංකුව : 0112-481594, 0112-481320, 0112-481612, 0112-481703

ශ්‍රී ලංකා මහ බැංකුව : 011-2398788, 0112-477261